සියලු ම හිමිකම් ඇවිරිණි/All Right Reserved / முழுப் பதிப்புரிமையுடையது

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
# இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம்
# SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION

**ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2019 (II)**

| කාලය: පැය 03 | නීතිය හා කළමනාකරණය (07) | විභාග අංකය<br>Index No / சுட்டெண்<br>.................................. |
|---|---|---|

- **එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න 02ක් තෝරාගෙන ප්‍රශ්න 05කට පිළිතුරු සැපයිය යුතුය.**
- **සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගින් ලැබේ.**

## I වන කොටස - (නීතිය)

1. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 10 සිට 14 දක්වා වන ව්‍යවස්ථාවල සඳහන් කොට ඇති මූලික අයිතිවාසිකම් මොනවාදැයි විස්තර කරන්න. (ලකුණු 20)

2. ශ්‍රී ලංකා නීතියේ මූලාශ්‍ර නම් කර ඉන් එක් මූලාශ්‍රයක් පැහැදිලි කරන්න. (ලකුණු 20)

3. i ප්‍රසිද්ධ දේශීය ඖෂධ සමාගමක් ප්‍රමුඛ සති අන්ත පුවත්පතක දැන්වීමක් පළ කරමින් ඖෂධ සමාගම නිෂ්පාදනය කරන තෙල් හිස ගැල්වීමෙන් සතියක් තුළ හිසකෙස් වැටීම වළකින බව ප්‍රචාරයණය කරන ලදී. හිසකෙස් වැටීම සිදුවුවහොත් සමාගම ඒ සඳහා රුපියල් මිලියනයක් ලබාදීමට සූදානම් බවත්, දැනටමත් සමාගම ඒ සඳහා කැපවී ඇති බව තහවුරු කිරීමට ප්‍රසිද්ධ බැංකුවක තැන්පතුවක රු. මිලියන 10 ක් වෙන්කර ඇති බවත්, ප්‍රසිද්ධ කරන ලදී.

   කමලා මෙම දැන්වීමේ සඳහන් තෙල් වර්ගය හිසේ ගැල්වූවද සතියක් තුළ ඇයගේ හිසකෙස් වැටීම නැවතී නැති නිසා අදාළ සමාගම පොරොන්දු වන්දි මුදල ලබාදෙන ලෙස දිසා අධිකරණය ඉදිරියේ නඩුවක් පවරන ලදී. මෙම නඩුවට වගඋත්තරකාර සමාගම පිළිතුරු බඳිමින් පවසා සිටියේ මෙය හුදු වෙළඳ ප්‍රචාරණයක් පමණක් බවය.

   අධිකරණයේ මතය කුමක් විය හැකිද? විස්තර කරන්න. (ලකුණු 10)

   ii ගිවිසුම් නීතිය යටතේ ඕනෑම පුද්ගලයෙකුට වලංගු ගිවිසුමකට එළඹීමට ශක්නුතාවයක් ඇත. එසේ වුවද වලංගු ගිවිසුමකට එළඹීමට සීමාවන් පැනවෙන අවස්ථාද නීතියේ දක්වා ඇත. අවම වශයෙන් එවන් අවස්ථා දෙකක් (02) උදාහරණ ලෙස දක්වමින් නීතිය ඉදිරියේ වලංගු ගිවිසුමකට එළඹීමට නීතිමය බාධා සහිත හෝ සීමා සහිත පුද්ගලයින් සම්බන්ධව විස්තර කරන්න. (ලකුණු 10)

4. පහත සඳහන් මාතෘකා අතුරින් හතරක් (04) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

   i. ගිවිසුම් නීතියේ යෝජනාව හෙවත් අර්පණය (Offer)
   ii. අගනා ප්‍රතිෂ්ඨාව (Intention or Due Consideration)
   iii. ප්‍රතිග්‍රහණය (Acceptance)
   iv. නීති විරෝධී ගිවිසුම
   v. රෝම ලන්දේසි නීතිය
   vi. මානව හිමිකම් කොමිෂන් සභාව (ලකුණු 5X4 = 20)

**II වන කොටස - (කළමනාකරණය)**

5. කළමනාකරුවන්ගේ භූමිකාවන් පිළිබඳ Henry Mintzberg ගේ වර්ගීකරණයේ කොටස් තුන (03) නම් කරන්න. ඉන් කොටස් දෙකක් (02) පිළිබඳව උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 20)

6. පහත සඳහන් කළමනාකරණ කාර්යයන් කෙටියෙන් විස්තර කරන්න.

   i. පාලනය
   ii. නායකත්වය
   iii. සැළසුම්කරණය
   iv. සංවිධානය (ලකුණු 5X4 = 20)

7. අ) ආයතනයක් සඳහා සංවිධාන ව්‍යුහයක් (Organizational Structure) තිබීමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 10)
   ආ) ඔබ දන්නා රාජ්‍ය ආයතනයක සංවිධාන ව්‍යුහය රූප සටහනක් මගින් ඉදිරිපත් කරන්න. (ලකුණු 10)
   (සම්පූර්ණ ලකුණු 20)

8. කළමනාකරුවන් සංවිධානයක් පාලනය කිරීම සඳහා මූල්‍ය හා මූල්‍ය නොවන පාලන ක්‍රම (Financial and Non-Financial Controlling Methods) භාවිත කරයි. ඉහත සඳහන් ක්‍රම දෙක (02) පිළිබඳව උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 20)

**************